## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය

### ලේකම් හා ගණකාධිකාරී තනතුර

මෙම සංගමයේ ලේකම් හා ගණකාධිකාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ත්‍රී/පුරුෂ දෙපර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සුදුසුකම් :*

   කළමණාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියේ නිලධාරියකු හෝ I පන්තියේ නිලධාරියකු වීම.

2. *අවශ්‍යතා :*

   2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය,

   2.2 2020.04.01 වැනි දිනට වයස අවු. 55ට වැඩි නොවීම.

   2.3 රාජ්‍ය සේවයේ වසර 15ට නොඅඩු සේවා කාලයක් තිබීම.

   2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රාමාණික දැනුමක්/හැකියාවක් තිබීම.

   2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet and Email භාවිත කිරීමේ හැකියාව

   2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

   2.7 දෙමළ භාෂාව දැන සිටීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ඇත.

   2.8 අවම වසර 2ක ද්විතීයන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානී/විනය බලධාරීගේ කැමැත්ත

3. *වැටුප :*

   3.1 අයදුම්කරු රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා

   3.2 සංගමය විසින් ලබා දෙන මූලික වැටුපෙන් 50% ක් වූ දීමනාව

4. රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම (අංක 1589/30 දරන 2009 පෙබරවාරි මස 20 දිනැති ***අති විශෙෂ ගැසට් පත්‍රය*** අනුව)

4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 142 සමග කියවිය යුතු 143 වන රීතිය අනුව - පරිශිෂ්ට අංක 10 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය ද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. (www.psc.gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය භාගත කළ හැක.)

2020.03.13 වැනි දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් (ඉහත 2.7 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එන්. එම්. විජේරත්න,
සභාපති.

2020 පෙබරවාරි මස 28 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02,
දුරකතන අංක : 011-2434598, 2473633
ෆැක්ස් : 0112434212
වෙබ් අඩවිය : www.goba.lk

**Source: Government Gazette (2020.02.28)**